# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශේෂ

අංක 2146/5 - 2019 ඔක්තෝබර් මස 21 වැනි සඳුදා - 2019.10.21

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

### රාජ්‍ය සේවා කොමිෂන් සභාව

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 57 (1) වන ව්‍යවස්ථාව ප්‍රකාරව රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් බලතල පැවරීම

01. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 57(1) වන ව්‍යවස්ථාව ප්‍රකාරව රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් බලතල පවරන ලද අංක 2004/49 හා 2017.02.01 දිනැති *අති විශෙෂ ගැසට් නිවේදනයට* අනුව සෞඛ්‍ය සේවා කමිටුව විසින් මේ දක්වා ගෙන ඇති තීරණයන්ට අගතියක් නොවන පරිදි සහ 2019.07.01 දින සිට බලපවත්වන පරිදි පහත සඳහන් පරිදි බලතල පැවරීම මෙයින් සංශෝධනය කරනු ලැබේ.

02. පහත දැක්වෙන සේවාවන් වල නිලධාරීන් විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා සංග්‍රහයේ 2(17) වගන්තිය යටතේ විශ්‍රාම ගැන්වීම සම්බන්ධයෙන් කටයුතු කිරීමට සෞඛ්‍ය විෂයභාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශ ලේකම් වෙත බලතල පවරනු ලැබේ.

- ශ්‍රී ලංකා සෞඛ්‍ය සේවයේ වෛද්‍ය සේවය සහ ශ්‍රී ලංකා ආයුර්වේද වෛද්‍ය සේවයේ නිලධාරීන්
- සෞඛ්‍ය විෂය භාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශය යටතට හා ආයුර්වේද දෙපාර්තමේන්තුව යටතට ගැනෙන, දීප ව්‍යාප්ත සේවාවකට අයත් නොවන අංක 06/2006 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ (II ඇමුණුම) හි අර්ථ නිරූපණය කර ඇති විධායක මට්ටමේ නිලධරයන්
- සෞඛ්‍ය විෂය භාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශය යටතට හා ආයුර්වේද දෙපාර්තමේන්තුව යටතට ගැනෙන, දීප ව්‍යාප්ත සේවාවකට අයත් නොවන අංක 06/2006 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ (II ඇමුණුම) හි අර්ථ නිරූපණය කර ඇති තෘතීයික මට්ටමේ අධි ශ්‍රේණියේ/ විශේෂ ශ්‍රේණියේ නිලධරයන්

රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් බලතල පවරන ලද අංක 2004/49 හා 2017.02.01 දිනැති *අති විශෙෂ ගැසට් නිවේදනයේ* සඳහන් අනෙකුත් කරුණු සහ ඒවාට විටින් විට කර ඇති සංශෝධනයන් නොවෙනස්ව පවතී.

රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අණ පරිදි,

එම්.ජී.බී. දයා සෙනරත්,
ලේකම්,
රාජ්‍ය සේවා කොමිෂන් සභාව.

2019 ඔක්තෝබර් මස 15 වැනි දින,
රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්යාලය,
1200/9, රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.

11 - 644


1A - PG 4714 — 20 (2019/10) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*